# ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
# பிரதம செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
# CHIEF SECRETARY'S OFFICE - WESTERN PROVINCE

"ශ්‍රාවස්ති මන්දිරය" 32, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත, කොළඹ 07.
" சிராவஸ்தி மந்திரய", 32, ஸ்ரீ மாக்கஸ் பர்னாந்து மாவத்தை, கொழும்பு 07.
"Sravasthi" Mandiraya, 32, Sir Marcus Fernando Mawatha, Colombo 07.

ප්‍රධාන ලේකම් /பிரதம செயலாளர்/Chief Secretary
දුරකථන/தொலைபேசி /Telephone 2698409
ෆැක්ස් /பெக்ஸ் /Fax 2694667

පොදු/பொது/General
දුරකථන / தொலைபேசி / Telephone 2691665,2682866, 2696027,2682869, 2682870


මගේ අංකය / எனது இல / My No. 3/2/2/7/6-xii
ඔබේ අංකය / உமது இல / Your No.
දිනය / திகதி / Date 2013.11. 05

## මුදල් චක්‍රලේඛ 14/2013

ආණ්ඩුකාර ලේකම් (බ.ප.),
අමාත්‍යාංශ ලේකම්වරු (බ.ප.),
සභා ලේකම් (බ.ප.),
පළාත් කොමිෂන් සභාවල ලේකම්වරු(බ.ප.),
නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු (බ.ප.),
දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් (බ.ප.),
අධිකාරීවල සභාපතිවරු (බ.ප.),
බස්නාහිර පළාතේ සියළුම ප්‍රාදේශීය ලේකම්වරු.

**<u>පළාත් සභාවේ ආයතන විසින් පවිත්‍රතා සේවා සපයාගැනීම.</u>**

"රාජ්‍ය ආයතන විසින් ආරක්ෂක හා පවිත්‍රතා සේවා සපයා ගැනීම" යන මැයෙන් යුතුව කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත්කර ඇති අංක LS/Sec/Misc/(1) හා 2013.08.30 දිනැති ලිපියෙහි පිටපතක් මේ සමඟ අමුණා එවමි.

02. පවිත්‍රතා සේවා ලබාගැනීමේදී පමණක් කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශ ලේකම්ගේ ලිපියේ සඳහන් විධිවිධාන බස්නාහිර පළාත් සභාව වෙත අදාලකර ගැනීමට ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා දී ඇත.

03. එහෙයින් කාර්යාල වෙත පවිත්‍රතා සේවා ලබාගැනීමේදී කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශ ලේකම්ගේ ලිපියෙහි සඳහන් විධිවිධාන පරිදි කටයුතු කරන ලෙස කාරුණිකව දන්වමි.

04. පවිත්‍රතා සේවා කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාවල මේ වන විට ක්‍රියාත්මක වන අවම වැටුප් හා සේවා කොන්දේසි පිළිබඳ තීරණවල පිටපතක්ද මේ සමඟ අමුණා එවමි.

ජේ.එම්.සී. ජයන්ති විජේතුංග,
ප්‍රධාන ලේකම්, පළාත් මුදල්
අමාත්‍යාංශ ලේකම් හා පළාත්
භාණ්ඩාගාර ලේකම්,
බස්නාහිර පළාත.

පිටපත් :- 01. විගණකාධිපති.
02. අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණන).
03. පරිගණක දත්ත ක්‍රියාකරු.

කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශය
தொழில், தொழில் உறவுகள் அமைச்சு
MINISTRY OF LABOUR AND LABOUR RELATIONS

තැ.පෙ. 1519, දෙවන මහල, කම්කරු මහ ලේකම් කාර්යාලය, නාරාහේන්පිට, කොළඹ 05.
த.பெ. இல. 1519, 2 ஆவது தளம் தொழில் செயலகம், நாரஹேன்பிட்டி, கொழும்பு 05.
P.O. Box 1519, 2nd Floor, Labour Secretariat, Narahenpita, Colombo 05.

මගේ අංකය / எனது இல. } LS/Sec/Misc/(1) ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2013.08.30

09 SEP 2013

6

2013-09-09

ප්‍රධාන ලේකම්,
බස්නාහිර පළාත් සභාව.

**<u>රාජ්‍ය ආයතන විසින් ආරක්ෂක සහ පවිත්‍රතා සේවා සපයා ගැනිම.</u>**

ඇතැම් රාජ්‍ය ආයතන විසින් ආරක්ෂක සහ පවිත්‍රතා සේවාවන් බාහිර ආයතන විසින් සපයා ගැනිම සඳහා මිල ගණන් කැඳවා අදාළ ටෙන්ඩර් ප්‍රදානය කිරිමේ දී එකී පඩි පාලක සභා වලට අදාළව සේවකයන් සඳහා ගෙවිය යුතු අවම වැටුප් පිළිබඳ එම කාල වකවානුව අනුව පවත්නා තීරණ පිළිබඳව නොසලකා ඉදිරිපත් කර ඇති අවම මිල ගණන පිළිබඳව පමණක් සලකා බලා අදාළ ටෙන්ඩර් පිරිනැමීමට කටයුතු කරන බවට පඩි පාලක සභා තීරණ වලට අදාළ වැටුප් අනුව මිල ගණන් සකස් කර ඉදිරිපත් කළ නමුත් ඒ මත, ඉදිරිපත් කළ මිල ගණන් ඉහල යාම හේතුවෙන් අදාළ ටෙන්ඩර් ලබා ගැනිමට නොහැකි වූ ආරක්ෂක සහ පවිත්‍රතා සේවාවන් සපයන ආයතන ගණනාවක් විසින්ම මා වෙත පැමිණිලි ඉදිරිපත් කර ඇත. අදාළ පඩි පාලක සභා අවම වැටුප් පිළිබඳව නොසලකා අවම මිල ගණන පිළිබඳව පමණක් සලකා බලා අදාළ ටෙන්ඩර් පිරිනැමීම ඇතැම් ආයතන විසින් සිදු කරන බව ඔවුන් සිය පැමිණිලි මගින් සඳහන් කර ඇත.

02. එබැවින් ඔබ පළාත් සභාව යටතේ ඇති විවිධ ආයතන මගින් ආරක්ෂක සහ පවිත්‍රතා සේවාවන් බාහිර ආයතන වෙතින් සපයා ගැනිම සඳහා එයට අදාළ මිල ගණන් කැඳවීමේ දී ආරක්ෂක සහ පවිත්‍රතා සේවා කර්මාන්තයන් පිළිබඳ පඩි පාලක සභාවන් මගින් ඒ ඒ කාල වකවානුවල තීරණය කොට ඇති අවම වැටුපට අනුකූල වන පරිදි මිල ගණන් සකස් කර මිල ගණන් කැඳවීමට අදාළ කාර්යයේ නිරත වන නිලධාරීන් වෙත උපදෙස් ලබා දීම පිණිස අදාළ ආයතන ප්‍රධානීන් දැනුවත් කරන ලෙසත් එකී මිල ගණන් ඉදිරිපත් කරන ආයතන විසින් ඒ අවස්ථාව වන විට පවත්නා පඩි පාලක සභා අවම වැටුප් අනුව මිල ගණන් ඉදිරිපත් කර තිබේද යන්න පිළිබඳව අදාළ තාක්ෂණික ඇගයිම් කමිටු වලදී සලකා බලන මෙන් උපදෙස් ලබා දෙන ලෙසත් එමෙන්ම මේ සම්බන්ධයෙන් ඇති වන ගැටළු මහ හරවා ගැනිම සඳහා තාක්ෂණික ඇගයිම් කමිටු සඳහා අදාළ ප්‍රදේශයේ කම්කරු කාර්යාලයේ සහකාර කම්කරු කොමසාරිස්ගේ සහය ලබා ගැනිමට කටයුතු කරන ලෙසට අදාළ ආයතන ප්‍රධානීන් දැනුවත් කරන ලෙසත් කාරුණිකව ඉල්ලා සිටිමි.

ආරක්ෂක සහ පවිත්‍රතා සේවා කර්මාන්තයන් පිළිබඳ පඩි පාලක සභා වල මේ වන විට ක්‍රියාත්මක වන අවම වැටුප් හා සේවා කොන්දේසි පිළිබඳ තීරණ වල පිටපත් ද ඔබගේ පහසුව සඳහා මේ සමඟ එවමි.

217

ඩබ්ලිව්.ජේ.එල්.යූ.විජයවීර
ලේකම්

275

# පවිත්‍රතා සේවා කර්මාන්තය

## උපලේඛනය

පවිත්‍රතා කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරනු ලදුව 1993/07/07 දින අංක 774/5 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළකරනු ලැබූ නිවේදනයේ සඳහන් උපලේඛණයේ සවිස්තරාත්මකව දක්වා ඇත්තා වූද, කලින් කල වෙනස් කරන ලද්දා වූද, අවසන් වරට 2008/06/30 දින අංක 1556/4 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පල කරන ලද නිවේදනයෙන් වෙනස් කරන ලද තීරණ පහත දැක්වෙන කොටස් ආදේශ කර ගෙන තවදුරටත් වෙනස් කරනු ලැබේ. 2010 .05.31 දිනැති 1656/10 දරණ ගැසට් නිවේදනය මඟින් පල කල සේවා කොන්දේසි පිළිබඳ තීරණ 2010.06.01 දින සිට වලංගු විය. 2010.08.27 දින අංක 1668/19 දරන ගැසට් නිවේදනය මගින් ගත් වැටුප් පිළිබඳ තීරණ 2010.09.01 දින සිට ක්‍රියාත්මක වේ. 2013.05.31 දිනැති 1812/30 දරණ ගැසට් නිවේදනය මඟින් වැටුප් පිළිබද තීරණ 2013.06.01 දින සිට ක්‍රියාත්මක විය.

**2013.06.01 දිනට අවම වැටුප**

| | | රු. ශත |
|---|---|---|
| ක්‍රියාකාරී සේවාවන් | - | 380.00 |
| සුපවයිසර් | - | 445.00 |

### I වන කොටස
### සාමාන්‍ය වැඩ කරන දවසක් යන්නෙහි අර්ථ නිරූපනය
### ( 24 වන වගන්තිය )

1. ආහාරය හෝ විවේකය සඳහා පැයක් ඇතුළුව වැඩ කරන සාමාන්‍ය දවසකට අයත් වන්නා වූ පැය ගණන පහත සඳහන් පරිදි විය යුතුය.

| | |
|---|---|
| සතියේ කිනම් හෝ දින 5 ක | පැය 09 |
| සතියේ එක් දිනක ( කෙටි වැඩ කරන දිනය ) | පැය 06 |

### II වන කොටස
### සාමාන්‍ය වැඩ කරන සතිය
### ( 24 වන වගන්තිය )

2. සාමාන්‍ය වැඩ කරන සතියකට අයත් පැය ගණන 45ට නොවැඩි විය යුතුයි.

### III වන කොටස
### සති නිවාඩුව
### ( 24 වගන්තිය)

සෑම සේව්‍යයකුම තමා යටතේ සේවය කරන සෑම සේවකයකුටම කෙටි වැඩ කරන දිනට පසුව එළඹෙන එක් දිනක් සතියේ නිවාඩු දිනය වශයෙන් දිය යුතුවන්නේය. එසේ වුවද පහත දැක්වෙන කොන්දේසි යටතේ සේව්‍යයාට, සේවකයා සති නිවාඩු දිනයේදී වැඩෙහි යෙදවිය හැකිය.

එදින කළ වැඩ සම්බන්ධයෙන් වැටුප් වශයෙන් සේවකයාට,

(ඒ) පළමුවන පැය 09 ( ආහාරය හෝ විවේකය සඳහා පැයක් ඇතුළුව ) සඳහා, අවම දෛනික ප්‍රමාණය මෙන් 1 ½ ක ප්‍රමාණයක් ගෙවිය යුතු වන අතර,

(බී) ඊට පසු වැඩ කළ සෑම පැයක් සඳහාම, අවම දෛනික ප්‍රමාණය 8න් බෙදා නිශ්චය කරගත් ප්‍රමාණය, මෙන් 1 ½ක ප්‍රමාණයන් අතිකාල වශයෙන් ගෙවිය යුතුය.

## ආණ්ඩුවේ නිවාඩු දවස්
## ( 25 වන වගන්තිය )

1. (අ) මෙහි ඡේදයේ සහ 2 වන ඡේදයේ විධිවිධාන වලට යටත්ව සෑම සේවායෝජකයෙකු විසින්ම තමා යටතේ සේවයේ යොදවා සිටින සෑම කම්කරුවකුටම 1971 අංක 29 දරණ නිවාඩු පනතෙහි අර්ථානුකූල පහත දැක්වෙන එක් එක් ආණ්ඩුවේ නිවාඩු දිනය වැටුප් සහිත නිවාඩු දිනයක් වශයෙන් ලබා දිය යුතුය.

(1). දෙමළ තෛපොන්ගල් දිනය
(2). ජාතික දිනය ( පෙබරවාරි 04 )
(3). මිලා-දුන්-නබි(මොහොමඩ් නබි නායකතුමන් වහන්සේගේ උපන්දිනය)
(4). සිංහල සහ හින්දු අළුත් අවුරුදු දිනය
(5). මැයි දිනය ( මැයි 01 )
(6). නත්තල් දිනය ( දෙසැම්බර් 25 )

2. ඉහත අනුඡේදයේ සඳහන් පරිදි යම් සේවකයකු ආණ්ඩුවේ කවර නිවාඩු දවසක හෝ සේවයේ යෙදවීමට සේවායෙකුට පහත සඳහන් කොන්දේසි යටතේ හැකියාව ඇත.

(I) ඉහත නිවාඩු දිනයේ සේවයේ නියුක්ත කළ සේවකයාට ඒ වෙනුවෙන් අදාල මාසයේ දිනකට ගෙවනු ලබන වැටුප මෙන් දෙගුණයකට සමාන වැටුපක් ගෙවීමට හෝ,

(II) එබඳු දවසක කළ වැඩ සඳහා ඒ වෙනුවට එම සේවකයාට එම මාසයේ ගෙවිය යුතු දිනක වැටුපට අමතරව එම වර්ෂයේ දෙසැම්බර් මස 31 හෝ එදිනට පෙර යෙදෙන දිනයක වැටුප් සහිත නිවාඩුවක් දිය යුතුය.

(III) රජයේ නිවාඩු දිනයක වැඩ කරන විට අතිකාල ගෙවීම වන්නේ පඩිපාලක සභා ආඥාපනතේ (136 වන අධිකාරය ) 25 වන වගන්තිය යටතේ පව්ත්‍රතා කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව මගින් ආණ්ඩුවේ නිවාඩු දවස් ලෙස ප්‍රකාශ කළ දවසක සේවකයකු සාමාන්‍ය වැඩ කරන දවසක් සංයුක්ත වන අවම පැය ගණනට වැඩියෙන් වැඩ කළ සෑම පැයක් සම්බන්ධයෙන්ම අවම අතිකාල ප්‍රමාණය විය යුත්තේ දිනක වැටුප 8න් බෙදා නිශ්චය කරගත් පැයට ගෙවන ප්‍රමාණය මෙන් දෙගුණයකි.